**ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය පිළිබඳව විගණකාධිපති වාර්තාව 2015 වර්ෂය**

ශීර්ෂය 162 - මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යාවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජනවාරි 31 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය හා ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලදී.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරින්ගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 18,016.13 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 7,437.90 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 10,578.23 ක් හෙවත් සියයට 58.72 ක ප්‍රතිපාදන ඉතිරිව තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2015 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 477.68 | 459.02 | 18.66 | 3.91 |
| මූලධන | 17,538.45 | 6,978.88 | 10,559.57 | 60.21 |
| **එකතුව** | **18,016.13** | **7,437.90** | **10,578.23** | **58.72** |

**2.2 අත්තිකාරම් ගිණුම**

**2.2.1 රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

අමාත්‍යාංශයට අදාළ විෂය අංක 16201 යටතේ රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** |
| 2.00 | 0.38 | 0.30 | 0.55 | 40.00 | 8.39 |

**2.3 අග්‍රිම ගිණුම**

අමාත්‍යාංශය යටතේ වූ අංක 7002/0000/00/0452/0015/000 දරන අග්‍රිම ගිණුමේ 2015 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.මිලියන 8.65 ක් විය.

**2.4 විගණන නිරීක්ෂණය**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3. ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම.**

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

| | **ලේඛන වර්ගය** | **අදාළ රෙගුලාසිය** |
|---|---|---|
| (i) | ස්ථාවර වත්කම් ලේඛනය | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |
| (ii) | විදුලි උපකරණ පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 454(2) |
| (iii) | බැරකම් පිළිබඳ ලේඛනය | මුදල් රෙගුලාසි 214 |
| (iv) | උප පත්‍රිකා පොත් ලේඛනය | මුදල් රෙගුලාසි 341 |

(v) ප්‍රසම්පාදන කම්ටුවේ හා තාක්‍ෂණ රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2
ඇගයීම් කම්ටුවල පැමිණීමේ මාර්ගෝපදේශය
ලේඛනය

**3.2 විගණන විමසුම්වලට පිළිතුරු දීම**

අමාත්‍යාංශය වෙත සමාලෝචිත වර්ෂයේදී ඉදිරිපත් කරන ලද විගණන විමසුම් 01 කට 2017 ජනවාරි 31 දින වන විටත් පිළිතුරු ඉදිරිපත් කර නොතිබුණි. එම විමසුමට අදාළ ගණනය කළ හැකි ගනුදෙනුවල වටිනාකම රු. 150,000,000 ක් වී තිබුණි.

**3.3 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.3.1 වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.3.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

**3.3.3 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, එම වාර්තාව 2017 ජනවාරි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4 වත්කම් කළමනාකරණය**

අමාත්‍යාංශයේ වත්කම් සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරික්ෂාවේදි පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණ පැවැත්වීම**

2014 ඔක්තෝබර් 17 දිනැති අංක 02/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015 වාර්ෂික භාණ්ඩ සමීක්‍ෂණය සිදු කර එම වාර්තා 2016 මාර්තු 17 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, අමාත්‍යාංශය විසින් එම වාර්තාව 2016 ජුලි 01 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**(ආ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

ආරක්‍ෂක අමාත්‍යාංශය සතුව තිබුණු රු.1,067,637 ක් වූ වත්කම් අමාත්‍යාංශය විසින් පරිහරණය කරන බව නියැදි විගණන පරීක්‍ෂාවේදී අනාවරණය විය.

3.5 **අනුකූල නොවීම**

**නිති, රිති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.**

නියැදි විගණන පරීක්‍ෂණවලදි නිරීක්‍ෂණය වු නීති, රිති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථා පහත විග්‍රාහ කර දැක්වේ.

| නීති,රිති හා රෙගුලාසිවලට යොමුව | | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| (අ) | **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| | මුදල් රෙගුලාසි 104 හා 103 | 719,471 | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ වාහන 6 ක් විවිධ අනතුරුවලට ලක්වී තිබූ අතර එකී වාහන අළුත්වැඩියා වියදම් රක්ෂණ සමාගම්වලින් ලබා ගෙන තිබුණත්, එකී වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| | **කළමනාකරණ සේවා චක්‍රලේඛ** | | |
| | 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන චක්‍රලේඛයේ 4.1.3 ඡේදය | 10,832,729 | කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතියේ, අර්ධ කාලීන ව්‍යාපෘති කාර්ය මණ්ඩලය සඳහා 1/3 ක දීමනා ගෙවීමේදී ඒ සඳහා අනෙකුත් දීමනා හැර නිලධාරීන්ගේ ව්‍යාපෘති තනතුරුට අදාළ මූලික වැටුප පදනම් කර ගත යුතු වුවත්, මූලික වැටුප හා අනෙකුත් දීමනා ඇතුළත්ව 1/3 ක දීමනා ගණනය කර ගෙවීම් කර තිබුණි. |
| (ඇ) | **රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්වරයාගේ ලිපිය** | | |
| | 2015 නොවැම්බර් 13 දිනැති අංක පීඑස්සී/ඒපීපී/07/897 දරන සියළුම අමාත්‍යාංශවල ලේකම්වරුන් සහ ආයතන ප්‍රධානීන් ඇමැතු ලිපිය. | | අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (සංවර්ධන) තනතුර සඳහා පත්කිරීමේදී ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ විශේෂ පන්තියේ නිලධාරියෙකු පත් කිරීමට කටයුතු නොකර හා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ පළමු පංතියේ නිලධාරියෙකු පත් කර තිබුණි. |

## 3.6 විදේශාධාර ව්‍යාපෘති

සමාලෝචිත වර්ෂයේදී අමාත්‍යාංශය විසින් විදේශ මුල්‍යාණය යටතේ ව්‍යාපෘති 03 ක් ක්‍රියාත්මක කර තිබුණි. ණය ගිවිසුම් අනුව එහි ඇස්තමේන්තුගත පිරිවැය එකතුව රු.මිලියන 48,647ක් වී තිබුණු අතර, එම ව්‍යාපෘති වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 4,358.4 ක් උපයෝජනය කර තිබුණි. මෙම විදේශාධාර ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

### (අ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) නිශ්චිත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ඉලක්ක ඉටු කර ගැනීමට අදාළ වගකීම් දක්වමින් සහ සමස්ත ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ මාසිකව, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් මූල්‍ය හා භෞතික ඉලක්ක මතුකර දක්වමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම ව්‍යාපෘතිය ආරම්භ කර වර්ෂ 3 ½ ක් ඉකුත් වීමෙන් පසුවත් පිළියෙල කර නොතිබුණි. ඒ අනුව 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් ඉටු කර තිබුණු මූල්‍ය හා භෞතික කාර්යසාධනය තහවුරු කර ගැනීම නොහැකි වී තිබුණි.

(ii) මුළු ව්‍යාපෘති පිරිවැය රු.මිලියන 27,890 කට සමාන එ.ජ.ඩො මිලියන 213 ක් වී තිබුණත්, 2015 දෙසැම්බර් 31 දින වන විට ඉන් සියයට 30 ක් වූ රු.මිලියන 8,517 කට සමාන එ.ජ.ඩො. මිලියන 64 ක් උපයෝජනය කර තිබුණි. ව්‍යාපෘතිය නිම කිරීමට තවත් වර්ෂ 1 ½ ක පමණ කාල පරිච්ඡේදයක් පමණක් ඉතිරිව තිබුණි. එම කාලය තුළ එ.ජ.ඩො මිලියන 149 ක් උපයෝජනය කර ව්‍යාපෘතියේ අරමුණු ඉටු කර ගැනීමේ අභියෝගයක් අමාත්‍යාංශය වෙත පැවැරී තිබුණි.

(iii) කොළඹ ජල ද්‍රෝණියේ ජල ගැලීම් අවදානම අවම කිරීම සඳහා උප සංරචක 12ක් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 6,403 ක්වූ පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම්වලින් වැඩ 07 ක් සැලසුම් අදියරේ ද, තවත් වැඩ 09 ක් පිළිබඳ ප්‍රසම්පාදන ක්‍රියාවලිය 2015 දෙසැම්බර් 31 දින වන විටද ක්‍රියාත්මක වෙමින් පැවතුණි.

### (ආ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් සිදු කළ නියැදි විගණන පරීක්ෂාවේදී පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමස්ථ ව්‍යාපෘති කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි මාසික, කාර්තුමය හා අර්ධ වාර්ෂික වශයෙන් ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළ මූල්‍ය හා භෞතික ඉලක්ක සපුරා ගැනීම සඳහා වගකීම පවරමින් පරිපූර්ණ විස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර ක්‍රියාත්මක කර නොතිබුණි .

(ii) ව්‍යාපෘති ඇගයීම් ලියවිල්ලේ II ඡේදය පරිදි ව්‍යාපෘතියේ වැඩ සැලැස්ම පදනම් කරගෙන සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක අයවැය ලේඛනයක් පිළියෙල කර නොතිබුණි. ඒ අනුව රු.මිලියන 4,410 ක් වූ දේශීය මූල්‍යනයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.මිලියන 459.01 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iii) ණය සපයනු ලබන නියෝජිතායතනය විසින් රු.මිලියන 19,257කට සමාන එ.ජ.ඩො මිලියන 147 ක ප්‍රතිපාදන සලසා තිබුණි. මුළු අරමුදල්වලින්, ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීමේ දින සිට වර්ෂ 02 ක් ඉකුත් වූ පසු 2015 දෙසැම්බර් 31 දින වන විට සියයට 2.00 ක් නියෝජනය වන රු.මිලියන 387.29 කට සමාන එ.ජ.ඩො මිලියන 2.93 ක් පමණක් උපයෝජනය කර තිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේ ව්‍යාපෘති මෙහෙයුම් කමිටුව රැස්වීම් වාර 06 ක් හා ව්‍යාපෘති උපදේශක කමිටුව රැස්වීම් වාර 04ක් පමණක් පවත්වා තිබුණි. මහ නගර සභා, මාර්ග සංවර්ධන අධිකාරිය, නාගරික සංවර්ධන අධිකාරිය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව හා ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයේ නියෝජිතයන් යථෝක්ත කමිටුවලට ස්ථිර පදනම මත පත්කර නොතිබුණි. ඒ අනුව නියෝජිතායතන අතර වගකීම් බෙදාහැරීම මඟින් ව්‍යාපෘතියේ මෙහෙයුම් පහසු කරගැනීම සඳහා කමිටු රැස්වීම්වලදී ඵලදායි තීරණ ගැනීමට නොහැකි වී තිබුණි.

(v) වර්ෂ 2 ක කාලයක් තුළ නිම කිරීමට සැලැසුම් කර තිබු ගාල්ල නගරයේ ප්‍රධාන ඇල මාර්ගවල හා කාණු පද්ධතියේ අලුත්වැඩියා වැඩ සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කිරීමට සැලැසුම් කර තිබු මාර්ග 03 ක් පුනරුත්ථාපනය කිරීම, කොටු පවුර තුළ ඇවිදින මාර්ගවල ඉදිකිරීම් වැඩ සහ ගාල්ල මහ නගර සභා ප්‍රදේශයේ වෙනත් යටිතල පහසුකම්වල වැඩිදියුණු කිරීම් වැඩ 2016 අප්‍රේල් 30 දින වන විටත් ආරම්භ කර නොතිබුණි. ගාල්ල නගරයේ ප්‍රතිසංස්කරණය කළ යුතු පාලම් 05ක් අතරින් සමගිවත්ත, කනම්පිටිය හා බෙලිගහ පාලම් 03 ක ප්‍රතිසංස්කරණ වැඩ සමාලෝචිත වර්ෂය අවසානයේ සියයට 50 කින් නිම කිරීම සඳහා අපේක්ෂාකර තිබුණද, එහි ප්‍රගතිය සියයට 7 ක පමණ පහළ අගයක් ගෙන තිබුණි.

(vi) “ආතර් සීට් විවින් ඩෙක් “ (Arthur’s Seat Viewing Deck) හි පුනරුත්ථාපන වැඩ සහ මහනුවර නගර ප්‍රදේශයේ ජල සම්පාදන පද්ධතිය සැලැසුම් කිරීම සහ ඉදිකිරීම අධීක්ෂණය, විශාලනය හා පුනරුත්ථාපන කාර්යයන් 2015 දෙසැම්බර් 31 දින නිම කිරීමට සැලසුම් කර තිබුණි. එදිනට පිළිවෙලින් සියයට 40 ක් හා සියයට 85 ක් මන්දගාමී ප්‍රගතියක් වාර්තාකර තිබුණි.

**(ඇ) කොළඹ අග නගර ආශ්‍රිත ජල ගැල්මෙන් පසු යථා තත්ත්වයට පත්වන නාගරික පරිසරය උදෙසා වූ භාර අරමුදල**

---

කොළඹ අගනගර ආශ්‍රිත ඒකාබද්ධ ජල ගැලීම් අවදානම් තක්සේරු කිරීම, කොළඹ අගනගර ආශ්‍රිත ජල ගැලීම් අවදානම අවම කිරීමේ උපාය මාර්ග හා ක්‍රියාකාරි සැලසුම් පිළියෙල කිරීම, නියාමන හා ඇගයීම් පද්ධතිය සංවර්ධනය කිරීම සහ ව්‍යාපෘති කළමනාකරණ හා පරිපාලනය නම් වූ සංරචක 04 ක් යටතේ භාර අරමුදලේ කාර්යයන් සිදු කිරීමට අපේක්ෂා කර තිබුණි. කෙසේ වුවද එම කාර්යයන් සැලැසුම් කළ පරිදි ආරම්භ කර නොතිබුණු අතර එහි ප්‍රතිඵලයක් ලෙස අරමුදල් මුල්‍යායනය කිරීම සඳහා 2014 ජුලි 30 දින සිට 2017 ජනවාරි 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය අවස්ථා 02කදී තවත් වර්ෂ 2½කින් දීර්ඝ කර තිබුණි. භාර අරමුදලේ ප්‍රගති වාර්තා අනුව, කොළඹ අගනගර ආශ්‍රිත නගර කළාපයේ තෙත් බිම් සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීමේ කාර්යය පමණක් සමාලෝචිත වර්ෂයේදී ආරම්භ කර තිබුණි.

(ඇ) **විදේශාධාර ව්‍යාපෘතිවල ඇතුළත් සමහර කර්මාන්ත අතහැර දැමීම**

කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ උප ව්‍යාපෘති 14 ක් රු.මිලියන 3,822.68 කට නිම කිරිමට සැලැසුම් කර තිබුණත්, අරමුදල් සපයා ගැනීමේ අපහසුතාවය මත එම උපව්‍යාපෘති මුළුමනින්ම අතහැර තිබුණි.

(ඉ) **ව්‍යපෘතියේ වත්කම් ඌන උපයෝජනය/නිෂ්ක්‍රියව පැවතීම**

ව්‍යාපෘතිය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්වා ගෙන යනු ලබන විශේෂ ඩොලර් ගිණුමේ 2015 ජනවාරි 01 දිනට රු.මිලියන 871.83 කට සමාන එ.ජ.ඩො මිලියන 6.65ක ශේෂයක් පැවතුණි. ඊට අමතරව, 2015 ජුනි 10 දින රු.මිලියන 503.25කට සමාන එ.ජ.ඩො මිලියන 03 ක අග්‍රිම ලබාදී තිබු අතර ඉන් රු.මිලියන 475.92කට සමාන එ.ජ.ඩො මිලියන 3.48 ක් සමාලෝචිත වර්ෂය තුළ ආපසු ලබාගෙන තිබුණි. එබැවින් ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා මුල්‍ය අවශ්‍යතාවයන් පිළිබඳ දුර්වල පුරෝකථනය හේතුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 888.68 කට සමාන එ.ජ.ඩො මිලියන 6.16 ක් විශේෂ ඩොලර් ගිණුමේ අතිරික්තව පැවතුණි.

## 3.7 දේශීය මුල්‍යකරණ මඟින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම

**මුදල් නිදහස් කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති**

ඉදිකිරීම් සම්බන්ධව නාගරික සංවර්ධන අධිකාරියට මුළු මුදලම නිදහස් කර තිබුණත්, එම ව්‍යාපෘති පිළිබඳ ප්‍රගතියක් වාර්තා වී නොතිබුණු අවස්ථා අනාවරණය විය. එම ව්‍යාපෘති පිළිබඳ විස්තර පහත සඳහන් කර ඇත.

(i) මට්ටක්කුලිය සුහසාධන මධ්‍යස්ථානය ඉදිකිරීම් සඳහා 2015 දෙසැම්බර් 31 දින රු.මිලියන 150 ක පරිපුරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරමින් අමාත්‍යාංශය විසින් ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. නාගරික සංවර්ධන අධිකාරියට එම මුදල නිදහස් කර ඇතත් එම ව්‍යාපෘතිය පිළිබඳ නිසි ප්‍රගතියක් ලබා නොතිබුණි.

(ii) හතරලියැද්ද නගර සංවර්ධන ව්‍යාපෘතිය සඳහා රු.මිලියන 242 ක වියදම් ඇස්මේන්තුවක් සකස් කර තිබු අතර එහි ඉදිකිරිම් කටයුතු 2012 සැප්තැම්බර් 06 දින ආරම්භ කර 2016 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණද, එහි ප්‍රගතියක් ලබා නොතිබුණි.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

අමාත්‍යාංශය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වු එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) 2007 අප්‍රේල් 05 දිනැති අංක 33 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය වැරදි ලෙස අර්ථකථනය කරමින් මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ පවතින උප සංරචකයක් වන කඩවත, කඩුවෙල, කොට්ටාව නගර සංවර්ධන ව්‍යාපෘතියේ, (3k ව්‍යාපෘතිය) කාර්ය මණ්ඩලයට රු.1,184,985 ක වැඩිපුර හිඟ වැටුප් ගෙවා තිබුණි.

(ආ) ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් තෙත් බිම් ප්‍රදේශ සඳහා ප්‍රධාන සැලැස්මක් පිළියෙල කිරීම සහ කොළඹ අග නගර ආශ්‍රිත කළාපය ඇතුළත, රටමැද ජල මාර්ගවල හා වැව්වල ජලයේ ගුණාත්මක තත්ත්වය පිළිබඳ තක්සේරුවක් සිදු කිරීමට දේශීය හා ජාත්‍යන්තර

උපදේශක සමාගම්වලින් ලංසු කැඳවා තිබුණි. ජාත්‍යන්තර තත්ත්ව ප්‍රමිතීන් පිළිබඳ සුදුසුකම් සහිත හා පළපුරුදු ඉංජිනේරු කාර්ය මණ්ඩලයක් සහිත උපදේශක සේවා සමාගමක් විසින් ඉදිරිපත් කරන ලද රු.මිලියන 17.09 කට සමාන එ.ජ.ඩො 129,860 ක් වූ අවම ලංසුව උපදේශකයන් තෝරා ගැනීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් පිළියෙල කරන ලද නිර්නායකයන්ට පටහැනිව රු. මිලියන 30.25 කට සමාන එ.ජ.ඩො 229,885 ක්වූ දෙවන අවම ලංසුව ඉදිරිපත් කරන ලද ජාත්‍යන්තර සමාගමකට උපදේශක සේවා කොන්ත්‍රාත්තුව පිරිනමා තිබුණි.

(ඇ) උපායමාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘති සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) ව්‍යාපෘති නියාමන ඒකකයේ අර්ධ කාලීන පදනම මත සේවය කරන ලද නිලධාරීන් 05 දෙනෙකුගේ රු.700,900 ක පාරිශ්‍රමික මුදලක්, ශ්‍රී ලංකා රජයෙන් ලැබුණු දායකයෙන් ගෙවා තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘති විසින් පවරන ලද වැඩ පැවරුම්වල ස්වභාවය තීරණය කිරීම සඳහා රාජකාරී වැඩ ලැයිස්තු හෝ යොමුගත කොන්දේසි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ii) ඉඩම් කැබලි 1632 ක් රු.මිලියන 662 ක ඇස්තමේන්තුගත පිරිවැයකට අත්පත් කර ගැනීමට ව්‍යාපෘතිය විසින් සැලසුම් කර තිබුණි. ඉන් ඉඩම් කැබලි 820 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අත්පත් කරගෙන තිබුණි. මේ සඳහා රු.මිලියන 235 ක් වැය කරන ලද අතර, ඉන් රු.මිලියන 188 ක් අතිරේක වන්දි ලෙස ගෙවා තිබුණි. ඉඩම් අත්පත්කර ගැනීම සහ ප්‍රතිස්ථාපනය කිරීමේ නිර්දේශ යටතේ ප්‍රදේශීය ලේකම් කාර්යාල 03 ක ඉඩම් කැබලි 14 ක් සඳහා රු.මිලියන 8.07 ක අතිරේක වන්දි ගෙවා තිබුණත්, එසේ ගෙවීමට අදාළ හේතු සහ අත්පත් කරගත් ඉඩම්වල ප්‍රමාණය යනාදි විස්තර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

**3.9 අවිධිමත් ගණුදෙනු**

**----------------------**

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බැවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම.**

**------------------------------------------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ගංවතුර හා අපවිත්‍ර ජලය බැහැර කිරීම සඳහා නව කාණු පද්ධති සැලසුම් කිරීම පිණිස අවශ්‍ය වන සුදුසු පරිගණක මෘදුකාංගය හදුනාගෙන නොතිබුණි. එසේම ඒ සඳහා විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාමාර්ග අනුගමනය කිරීමෙන් තොරව වෙනස් පරිගණක මෘදුකාංග 2ක් රු.මිලියන 33.88 ක් වැය කර මිලදී ගැනීමට සිදු වී තිබුණි.

(ආ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය සඳහා South East Asia Technology Co. Ltd Thailand ආයතනයෙන් උපදේශක සේවා ලබා ගැනීමට කටයුතු කර තිබුණි. එම උපදේශන කාර්යභාර්ය නිමකර භාරදීමට නියමිත කාලය ඉක්මවා වසර 02½ කට වැඩි කාලයක් ප්‍රමාද කර තිබුණි. 2017 ජුනි මාසය වන විට එම ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිතව තිබුණත් ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන සැලැස්මට අනුව ඇතැම් උපදේශන සේවාවන් සහ කාර්යයන් 2020 වර්ෂය දක්වා ඉටු කිරීමට සැලසුම් කර තිබුණි.

(ඈ) උපාය මාර්ගික නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ මහනුවර නගරයේ භූගත ජල ටැංකි 03ක ඉදිකිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය ප්‍රමාණයට වැඩියෙන් රු.මිලියන 13.40 ක් වටිනා වානේ කම්බි ටොන් 67 ක් ප්‍රසම්පාදනය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස අනවශ්‍ය ලෙස පිරිවැය මත රු.මිලියන 2.68 ක වැඩ පූර්ව අත්තිකාරම් කොන්ත්‍රාත්කරුට වැඩියෙන් ගෙවා තිබුණි. එම ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කර තිබුණු අංක 01 දරන ඉල්ලීම් බිල්පත යටතේ ප්‍රමාණපත්‍ර විෂයයන් 09 ක් සඳහා රු.මිලියන 1.2 ක් වැඩි පුර ගෙවා තිබුණි.

(ඇ) කොළඹ අගනගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය යටතේ ක්‍රියාත්මක වන නියෝජිත ආයතනවල ධාරිතා වර්ධනය සඳහා උපයෝගිතා වාහන මිලදී ගෙන තිබුණි. එම වාහන මිලදී ගැනීමේදී භාණ්ඩාගාරයකට ව්‍යාජ තොරතුරු ඉදිරිපත් කර අධිසුඛෝපභෝගී නවීනතම මාදිලියේ ප්‍රාඩෝ රථ දෙකක් සහ බස් රථයක් මිලදී ගැනීමට රු.59,145,494 ක් වැය කර තිබුණි. එවැනි වියදම් කිරීමේ හේතුවෙන් ප්‍රමාණවත් අරමුදල් නොමැතිවීම නිසා ව්‍යාපෘතිය යටතේ වූ උප ව්‍යාපෘති 19 ක් මුළුමනින්ම නවතා දැමීමට කටයුතු කර තිබුණි.

## 3.10 අනාර්ථික ගනුදෙනු

------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී අනාවරණය වූ අරපිරිමැස්මෙන් තොරව එළඹ තිබුණු ගනුදෙනු පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) කොළඹ අගනගර ආශ්‍රිත ව්‍යාපෘතියේ සේවය කරන නිලධාරීන්ගේ සේවක අර්ථසාධක අරමුදල් දායකයන් ගෙවීමේ ප්‍රමාදය මත රු.67,320 ක අධිභාරයක් ගෙවීමට සිදු වී තිබුණි.

(ආ) කොළඹ අගනගර ආශ්‍රිත ව්‍යාපෘතිය යටතේ බැද්දගාන ජෛව විවිධත්ව උද්‍යානය ඉදිකිරීම සම්බන්ධයෙන් මුදල් ගෙවීමේදී කොන්ත්‍රාත්තුව ලබාගත් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයට (CECB) රු.92,070,585 ක් විධිමත් පරීක්ෂාවකින් තොරව වැඩිපුර ගෙවා තිබුණි.

(ඇ) භාණ්ඩාගාරයෙන් ලැබුණු අරමුදල්වලින් නිලධාරියෙකුගේ ආචාර්ය උපාධිය හැදෑරීම වෙනුවෙන් පාඨමාලා ගාස්තු ලෙස රු.150,000 ක් වැයකර තිබුණි.

(ඈ) හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂ ලෙසත් රේඛීය අමාත්‍යාංශයේ අතිරේක ලේකම් (තාක්ෂණ) ලෙසත් කටයුතු කිරීම වෙනුවෙන් ඔහුගේ නිල වාහනය සඳහා මසකට රු.19,550 ක ඉන්ධන දීමනාවක් වැටුපට එකතු කර ලබා දී තිබුණි. එම දීමනාව භාවිතාකර ඉන්ධන වාහනයට යොදවා නොතිබුණි. හිටපු ව්‍යාපෘති අධ්‍යක්ෂවරයා ව්‍යාපෘතියේ සේවය කළ 2012 මාර්තු මාසයේ සිට 2015 ජුනි මාසය දක්වා වූ මාස 38 ක කාලය තුළ ව්‍යාපෘතියෙන් මසකට ලීටර් 120 බැගින් ලබාගත හැකි ඉන්ධන ප්‍රමාණය ලීටර් 4560 ක් වුවද, ලීටර් 10813 ක් ලබාගෙන තිබුණි. ඒ අනුව චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව රු.718,980 ක වටිනා ඉන්ධන ලීටර් 6252 ක් වැඩිපුර ලබාගෙන තිබුණි.

**3.11** **කළමනාකරණ දුර්වලතා**

**------------------------------**

**කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය**

**---------------------------------------------------------**

නියැදි විගණන පරික්ෂණවලදී පහත සඳහන් දුර්වලතා අනාවරණය විය.

(අ) ව්‍යාපෘති කාර්යාලයේ ප්‍රයෝජනය සඳහා ගිණුම් තැබීමේ හා ව්‍යාපෘති සමාලෝචන පරිගණක මෘදුකාංගයක් ලබා ගැනීම සඳහා අත්තිකාරම් වශයෙන් රු.1,000,575ක් ගෙවීම් කර වසරකට වඩා වැඩි කාලයක් ගතවී තිබුණද, එකී මෘදුකාංගය ස්ථාපිත කර නොතිබුණි.

(ආ) කොළඹ අග නගර ආශ්‍රිත නාගරික සංවර්ධන ව්‍යාපෘතිය 2015 වර්ෂය අවසාන වන විට ඉතාම අඩු කාර්යසාධනයක් පෙන්වා තිබුණි. තවද ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනවල නිලධාරීන් සහ ව්‍යාපෘති නිලධාරීන් සමඟ ප්‍රගති සමාලෝචන රැස්වීම් ඉතාම අඩු ප්‍රමාණයක් සහ ව්‍යාපෘති නියාමන කමිටු රැස්වීම් අවම වශයෙන් මාස 2කට වතාවක් පැවැත්විය යුතු වුවත්, වර්ෂයකට රැස්වීම් වාරයක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්කරුවන්ගේ වැඩ කිරීමේ හැකියාව පිළිබඳව නොසලකා කොන්ත්‍රාත් කිහිපයක් එකවර ප්‍රදානය කිරීම හේතුවෙන් පහත දැක්වෙන පරිදි කොන්ත්‍රාත් නිම කිරීමේ කාලය දීර්ඝකර තිබුණි.

(i). ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 374 ක් වූ කොන්ත්‍රාත් 06 ක් එකම කොන්ත්‍රාත්කරුවකුට පිරිනමා තිබුණි. මේ නිසා එම කොන්ත්‍රාත්තුවල වැඩ නිම කිරිම සඳහා දින 02 ක සිට දින 114 ක් දක්වා කාලය දීර්ඝ කර තිබුණි.

(ii). ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 1,620 ක් වූ කොන්ත්‍රාත් 05 ක් වෙනත් කොන්ත්‍රාත්කරුවකු වෙත පිරිනමා තිබුණු අතර, එහි කාලය දින 117 ක සිට දින 209 ක් දක්වා දීර්ඝ කර තිබුණි.

(iii). ඇස්තමේන්තුගත පිරිවැය රු.මිලියන 4,724.09 කට පිරිනමන ලද කොන්ත්‍රාත් 09 ක යෙදි සිටි වෙනත් කොන්ත්‍රාත්කරුවන් තිදෙනෙකු සඳහා දින 98 ක සිට දින 188 දක්වා කාලය දීර්ඝ කිරීම් ලබාදී තිබුණි.

**3.12** **මානව සම්පත් කළමනාකරණය**

**(අ)** **අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2015 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| **සේවක වර්ගය** | | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 31 | 16 | 15 | - |
| (ii) | තෘතියික මට්ටම | 06 | 02 | 04 | - |
| (iii) | ද්විතියික මට්ටම | 95 | 25 | 70 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 44 | 12 | 32 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | - | 04 | - | 04 |
| | **එකතුව** | **176** | **59** | **121** | **04** |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසානයේ තෘතියික මට්ටමේ එක් නිලධාරියෙකු සහ ද්විතික මට්ටමේ නිලධාරීන් දෙදෙනෙකු ද තාවකාලිකව බඳවාගෙන තිබුණි.

**(ආ)** **වෙනත් ආයතනවලින් ලබාගත් මානව සම්පත්**

අමාත්‍යාංශයේ කටයුතු සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් වැටුප් ගෙවීමකින් තොරව අනුයුක්ත කරගෙන තිබුණි.